# විද්‍යාර්ථීන්ගේ ශිෂ්‍ය සුභසාධන අරමුදල් භාවිතය පිළිබඳ අධ්‍යයනයක්

**එස්. සී. ලසන්ති**[1]

**සංක්ෂේපය**

විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන කටයුතු වඩාත් පහසු කර ගැනීම සඳහා සලසන්නා වූ ශිෂ්‍ය සුභසාධනයන් අතුරින් වඩාත් කතා බහට ලක්වෙන මාතෘකාවක් ලෙස ශිෂ්‍ය සුභසාධන අරමුදල් දැක්විය හැක. එනම් ශිෂ්‍යාධාර හා මහපොළ වේ. විද්‍යාර්ථීන් ශිෂ්‍ය සුභසාධන අරමුදල් වැඩිපුර වැය කරනු ලබන්නේ කුමන කාරණාවක් සඳහා ද යන්න විමසීම මෙහි මූලික පරමාර්ථය විය. මෙසේ  අරමුදල් ශිෂ්‍යයින් තම අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා කෙසේ වියදම් කරන්නේ ද යන්න පිළිබඳව කැලණිය විශ්වවිද්‍යාලයීය සිසුන් 100ක් ඇසුරින් ලබාගත් නියැදියක් මඟින් මෙම අධ්‍යයනය කරන ලදී. ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් ප්‍රාථමික දත්ත රැස්කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. නියැදිය අධ්‍යයනය කිරිමෙන් ලබාගත් තොරතුරු බොහොමයක් ගුණාත්මක දත්ත වන බැවින් ඒ සඳහා වඩාත් උචිත සංඛ්‍යාන ශිල්පීය ක්‍රමයන් භාවිතා කරමින් මෙම දත්ත විශ්ලේෂණය කරන ලදී. මුදල් වැය කරනු ලබන ආකාර ලෙස ආහාර, රූපලාවන්‍ය කටයුතු, අධ්‍යාපනය, දුරකථන පෙර ගෙවුම්පත් යන ඒවා මුල්කර ගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. සියලුම පීඨ ගෙන දත්ත විශ්ලේෂණය කළ විට පෙනී ගියේ විද්‍යා, සමාජ හා මානව ශාස්ත්‍ර පීඨයෙන් ලැබෙන්නා වූ ශිෂ්‍ය සුභසාධන අරමුදල් වැඩිපුර ආහාර සඳහා ද වාණිජ හා කළමණාකරණ පීඨය වැඩිපුර රූපලාවන්‍ය කටයුතු සඳහා ද මෙම මුදල් වැය කරනු ලබයි. අනෙකුත් පීඨවලට වඩා වාණිජ හා කළමණාකරණ පීඨය වැඩි කාලයක් රැකියාස්ථ පුහුණුවේ නිරත වීම රූපලාවන්‍ය සඳහා වැඩිපුර වැය වීමට හේතු විය. මේ අනුව විද්‍යාර්ථයින්ට ලැබෙන ශිෂ්‍ය සුභසාධන අරමුදල් වැඩිපුර වියදම් කරනුයේ, තම ආහාර වියදම් සඳහා බව අපට පැහැදිලි වේ. ශිෂ්‍ය සුභසාධන අරමුදල්හි ප්‍රමාණවත් බව විමසීමේදි විද්‍යාර්ථයින්ගේ මතය වූයේ, එම මුදල් ඔවුන්ට ඔවුන්ගේ කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන බවයි. මේ සඳහා විශ්වවිද්‍යාල ආපනශාලා මඟින් සකසනු ලබන ආහාර සඳහා වූ මිළ ගණන් අඩු කිරිම, ශිෂ්‍යාධාර මුදල් වැඩි කිරිමට කටයුතු කිරිම තුළින් වියදම තුලිත කර ගැනීම සඳහා යෝජනා ලෙස ඉදිරිපත් කළ හැක.

**මුඛ්‍ය පද :** විද්‍යාර්ථීන්, අරමුදල්, සුභසාධනය, පීඨ

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, chathusenevirathne93@gmail.com